# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# தேசிய வரவுசெலவுத் திட்டத் திணைக்களம்
# DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத்திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

**Web Site:** www.treasury.gov.lk **e-mail:** budget@nbd.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/GPS/130/9/14/MC-8 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2019.11. 22 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත
ආයතනවල සභාපතිවරුන් වෙත.

**2014/2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබා දී ඇති යතුරුපැදි සම්බන්ධ පොදු උපදෙස්**

ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබා දීමට අදාළව නිකුත් කරන ලද 2014.07.23 දිනැති අයවැය චක්‍රලේඛ අංක 2/2014 හා ඊට පසුව නිකුත් කරන ලද පොදු උපදෙස් ලිපි කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. මෙම යෝජනා ක්‍රමය යටතේ යතුරුපැදි ලබා දී දැනට වසර 5ක් ඉක්මවී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු පිළිබඳව විවිධ විමසීම් හා පැහැදිලි කිරීම් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙමින් පවතියි. දැනට ඉදිරිපත් වී ඇති විමසීම් වෙනුවෙන් පහත පැහැදිලි කිරීම් ඔබගේ අවධානයට යොමු කරමි.

02. **ලබා දුන් යතුරුපැදි/ස්කූටර් වසර 05 ඉක්මවූ පසු අයිතිය පවරා දීම**

මගේ අංක BD/GPS/130/9/14/MC-8 හා 2017.07.03 දිනැති උපදෙස් ලිපියේ අංක 10 වගන්තිය ප්‍රකාරව යතුරුපැදිය/ස්කූටරය ලබාගත්/ලබාදුන් දිනය ලෙස යතුරුපැදිය/ස්කූටරය ලියාපදිංචි කල දිනය සැළකිය යුතු අතර, එම දිනයේ සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මයන දිනයේ දී යතුරුපැදියේ/ස්කූටරයේ අයිතිය අදාළ නිලධාරියා සතු විය යුතුය. ඒ අනුව, යතුරුපැදිය/ස්කූටරය ලියාපදිංචි දිනයේ සිට අවුරුදු 05 ඉක්මවූ පසු යතුරුපැදිය/ස්කූටරය ලබා ගත් නිලධාරියා විසින්, දැනටමත් තමා ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල නියැලෙන බවට හා අදාළ යතුරුපැදිය/ස්කූටරය ලබා ගැනීමේ දී මූලිකව ගෙවන ලද රු.50,000/- හෝ 45,000/- මුදල ගෙවා ඇති බවට ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව යතුරුපැදිය/ස්කූටරය පවරා ගැනීමට අවශ්‍ය ලියකියවිලි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එම යතුරුපැදිය/ස්කූටරය පවරා ගත යුතුවේ. මෙම යෝජනා ක්‍රමය යටතේ එක් නිලධාරියකුට එක් යතුරුපැදියක්/ස්කූටරයක් පමණක් හිමි වන බවද අවධාරණය කරනු කැමැත්තෙමි.

03. **යතුරුපැදි/ස්කූටර් රක්ෂණය කිරීම**

යතුරුපැදිය/ස්කූටරය ලියාපදිංචි දිනයේ සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මයන දිනයේ දී, යතුරුපැදියේ අයිතිය අදාළ නිලධාරියා හට හිමි වන බැවින්, ඊළඟ වර්ෂයේ සිට යතුරුපැදිය/ස්කූටරය රක්ෂණය කිරීම යතුරුපැදි හිමිකරුගේ අභිමතය පරිදි සිදුකල හැකිය.

පී.බී.එස්.සී.නෝනිස්
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:**

1. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - ඉහත උපදෙස් අනුව අදාල යතුරුපැදි/ස්කූටර් කඩිනමින් පවරා දීම සඳහා
2. සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව
3. සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
4. ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල
5. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
6. විගණකාධිපති

(2–6) කරු. දැන ගැනීම පිණිස


| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 0094-11-2484665<br>0094-11-2484639 (Fax) | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 0094-11-2484669<br>0094-11-2484853 | ෆැක්ස් අංකය<br>தொலைநகல் இல.<br>Fax No. | 0094-11-2484807 |